# දකුණු පළාත් සභාව
தென் மாகாண சபை
# SOUTHERN PROVINCIAL COUNCIL
## අධ්‍යාපන , ඉඩම් හා ඉඩම් සංවර්ධන , මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
கல்வி, காணி மற்றும் காணி அபிவிருத்தி, லைகவ் மற்றும் தகவல்நெடுஞ்சா றுறை அமைச்சு
**Ministry of Education, Land & Land Development, Highways & Information**

බිම් මහල, "දක්ෂිණ පාය" , ලබුදූව, ගාල්ල. கீழ் மாடி,"தக்ஷின பாய",லபுதுவ,காலி. Ground Floor, "Dakshina Paya" , Labuduwa, Galle.


| | | |
|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. } SP/EDUMIN/EDU/24/21 | ඔබේ අංකය. / உனது இல. / Your No. } | දිනය. / திகதி. / Date. } 2026.09. 07 |

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,

**<u>දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු හා දකුණු පළාත් සභා පාසල් වල පුරප්පාඩු සඳහා විදුහල්පති ශ්‍රේණිධාරීන් ස්ථානගත කිරීම - 2026</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත යොමු කළ මගේ සමාංක හා 2026.08.25 දිනැති ලිපිය හා බැඳේ.

02. ඔබ විසින් මා වෙත එවා තිබූ විදුහල්පති ශ්‍රේණිධාරි පුරප්පාඩු අනුව අදාල පුරප්පාඩු ප්‍රසිද්ධ කළද, එම පුරප්පාඩු ලේඛන වල සංශෝධන සිදුවිය යුතු බව නැවත මා වෙත දැනුම් දී ඇත. ඒ අනුව ඇමුණුම 01හි සඳහන් පාසල් පුරප්පාඩු ලේඛනයෙන් ඉවත් විය යුතු බවත්, ඇමුණුම 02 හි සඳහන් පාසල් පුරප්පාඩු ලේඛනයට ඇතුළත් විය යුතු බවත් කාරුණිකව දැනුම් දෙමි.

03. ඒ අනුව දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු/ පුරප්පාඩු සඳහා ස්ථානගත කිරීම සඳහා වන අයදුම්පත් ඔබ වෙත භාර ගැනීමේ අවසන් දිනය 2026.09.18 දින දක්වා දීර්ඝ කරන බවත්, එම අයදුම්පත් ඔබගේ නිර්දේශ සහිතව දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් 2026.09.30 දිනට පෙර මා වෙත යොමු කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

04. එමෙන්ම මේ වන විට තම අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් යොමු කර ඇති හෝ තම අයදුම්පත් කලාප අධ්‍යාපන කාර්යාලයට භාර දී ඇති නිලධාරීන්ද ඉහත පාසල් ඉල්ලුම් කරන්නේ නම් නව අයදුම්පත්‍රයක් සම්පූර්ණ කර (මීට පෙර අයදුම්පත්‍රයක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත භාර දුන් බව එම අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතුය.) සෘජුවම මා වෙත යොමු කරන ලෙසට එම විදුහල්පති ශ්‍රේණිධාරීන් දැනුවත් කරන ලෙසද කාරුණිකව දන්වමි.

05. තවද මෙම ලිපිය පිළිබඳ ඔබ කලාපයේ සියලු විදුහල්පති ශ්‍රේණිධාරීන් දැනුවත් කිරීම සඳහා කඩිනම් පියවර ගන්නා ලෙසද වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙමි.

එන්.කේ.ආර්. පතිරණ
ලේකම්
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
දකුණු පළාත.

එන්.කේ.ආර්.පතිරණ,
ලේකම්.

පිටපත - දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - දැ.ගැ.ස


ලේකම් / செயலாளர் / Secretary } 091-2246156, 091-2030701
කාර්යාලය / காரியாலயம் / Office } 091-2030700 පාලන / நிர்வாகம் / Administration; 091-2030705 අධ්‍යාපන / கல்வி / Education; 091-2030703 සැලසුම් / திட்டமிடல் / Planning; 091-2030702 ගිණුම් / கணக்காய்வ / Accounts
ෆැක්ස් / பெக்ஸ் / Fax } 091-2246157, 091-2234044
ඊමේල් / மின்னஞ்சல் / E-mail : secretary@edu.min.spgov.lk  ක්ෂණික ඇමතුම් / அதிரடி அழைப்பு / Hot Line : 091-2030700  වෙබ් අඩවිය / இணையத்தளம் / web site : www.edumin.sp.gov.lk